Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# ශ්‍රී ලංකාවේ පාසැල් සිසුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි සමාජ ආර්ථික සාධකවල බලපෑම: කොළඹ නගරයේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

**ආර්.එල්.සමරවීර**[1]

---

සංක්ෂේපය

අතීතයට සාපේක්ෂව වර්තමානයේ දී අධ්‍යාපනය වඩාත් තරඟකාරී මුහුණුවරක් ගෙන ඇත. මෙසේ අධ්‍යාපනයට තරඟකාරී බවක් ඇති වූයේ නවීකරණය, කාර්මීකරණය හා නාගරීකරණය යන සංකල්ප තුන ඔස්සේ සිදු වූ සමාජ පරිවර්තනයත් සමඟ ය. විශේෂයෙන්ම 1977 විවෘත ආර්ථිකය ඇති වීමත් සමග නිර්මාණය වූ රැකියා වෙළෙඳපොළෙහි අවශ්‍යතාවලට සරිලන ශ්‍රම සංචිතයක් සපයා ගැනීමේදී අධ්‍යාපන මට්ටම අනිවාර්ය විය. එහෙයින් නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් දෙමාපියන්ට ද ආදායමෙන් විශාල පිරිවැයක් දැරීමට සිදු වේ. එසේ විශාල මුදලක් වියදම් කළ ද දරුවන්ගේ අධ්‍යාපන සාධනය එකිනෙකාගෙන් වෙනස් ය. මෙසේ අධ්‍යාපන සාධනයෙහි විෂමතාවයන් සඳහා හේතු වන්නේ කුමන හේතු සාධක ද යන්න සොයා බැලීම කාලීන අවශ්‍යතාවයකි. මෙම අධ්‍යයනයේ දී බලාපොරොත්තු වන්නේ මෙසේ සිසුන්ගේ අධ්‍යාපන සාධනය වෙනස් වීම කෙරෙහි බලපාන සමාජ ආර්ථික සාධක හඳුනා ගෙන ඒවා අධ්‍යාපන සාධනයට කුමන ආකාරයෙන් බලපෑම් කරයි ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීමයි

කොළඹ නගරයේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් උපකාරක පංති සහ පෞද්ගලික පෙර වරු පාසල් වලින් ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය භාවිත කරමින් 50 ක නියැදියක් තෝරා ගත් අතර ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මඟින් ලබා ගත් ප්‍රාථමික දත්ත ඇසුරින් කල්පිත පරීක්ෂා සහ බහුගුණ ප්‍රතිපායනය යොදා ගෙන මෙම විශ්ලේෂණය සිදු කෙරේ.

එම සමීක්ෂණයට අනුව පවුල් පරිසරය ආශ්‍රිත සමාජ ආර්ථික සාධක තම අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන බව ප්‍රතිචාරකයන්ගෙන් 88% ක් ප්‍රකාශ කර ඇත. එමෙන්ම විභාග සමත් වීම සඳහා උපකාරක පංති යාම අනිවාර්ය බව 70% ක් ප්‍රකාශ කර තිබේ. එසේම දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, කුටුම්භ ආදායම, දෙමාපියන්ගේ උනන්දුව හා පෙළඹවීම, උපකාරක පංතිවලට සහභාගී වීම යන සාධක සිසුන්ගේ අධ්‍යාපන සාධනය සඳහා ධනාත්මක ලෙස බලපානු ලබන අතර ඉගෙනුම ලබන සහෝදර සහෝදරියන් ගණන ඉහළ යාම සෘණාත්මකව බලපානු ලබයි. ඒ අනුව පවුල් පරිසරය ආශ්‍රිත සමාජ ආර්ථික සාධක සිසුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් එල්ල කරන බව නිගමනය කළ හැකිය.

මුඛ්‍ය පද : අධ්‍යාපනය, අධ්‍යාපන සාධනය, පාසැල් සිසුන්, සමාජ ආර්ථික සාධක , ශ්‍රී ලංකාව

---

1.විශේෂවේදී තෙවන වසර, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය කැළණිය විශ්වවිද්‍යාලය
rajithasamaraweera@ymail.com